අධ්‍යාපන, විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශය
கல்வி, விஞ்ஞான மற்றும் தொழில்நுட்ப அமைச்சு
Ministry of Education, Science and Technology
'ඉසුරුපාය', බත්තරමුල්ල, ශ්‍රී ලංකාව.
'இசுருபாய', பத்தரமுல்லை, இலங்கை.
'Isurupaya', Battaramulla, Sri Lanka.
+94112785141-50 +94112785818
info@moe.gov.lk www.moe.gov.lk

මගේ යොමුව / எனது இல. / My Ref.

ඔබේ යොමුව / உமது இல. / Your Ref.

දිනය / திகதி / Date 2024.09. 29

**5ශ්‍රේණිය ශිෂ්‍යත්ව විභාගය - 2024 සම්බන්ධයෙන් උද්ගතවූ ගැටලුවට විසඳුමක්**

2024 සැප්තැම්බර් 15 වන දින පවත්වන ලද 5ශ්‍රේණිය ශිෂ්‍යත්ව විභාගයේ ප්‍රශ්නපත්‍රවල ඇතුළත් ප්‍රශ්න විභාගයට කලින් සාකච්ඡා කරන ලදැයි ඉදිරිපත්වූ පැමිණිලි සම්බන්ධයෙන් විභාග දෙපාර්තමේන්තුව වහාම විමර්ශන ආරම්භ කරන ලදී. එම විමර්ශනවලදී අනාවරණය වූයේ පළමු ප්‍රශ්න පත්‍රයට අදාළ ප්‍රශ්න තුනකට සමාන ප්‍රශ්න ඇතුළත් ලේඛනයක් විභාගයට පෙර සාකච්ඡා කර ඇති බවත්, එය පෙර දින සමාජ මාධ්‍ය ඔස්සේ සංසරණය වූ බවත් ය. ඒ අනුව, විභාග දෙපාර්තමේන්තුව එම මූලික පරීක්ෂණ වාර්තාව පදනම් කර ගනිමින් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව වෙත පැමිණිලි කළ අතර අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් ඔවුන්ගේ පරීක්ෂණවලින් අතුරු වාර්තාවක් අධ්‍යාපන ලේකම් වෙත ඉදිරිපත් කර ඇත. එම වාර්තාව මගින් සමාජ මාධ්‍ය ජාලා ඔස්සේ සංසරණය වූ ලේඛනය විභාගයට පෙර සාකච්ඡා කර ඇති බවත්, ඒ අනුව විභාගයේ පළමු ප්‍රශ්න පත්‍රයේ ප්‍රශ්න තුනක් විභාගයට පෙර පිට වී ඇති බවත්, තහවුරු කර ඇත. මේ සම්බන්ධයෙන් ලැබුණු අනෙකුත් පැමිණිලි විමර්ශනයට ලක්කළ අතර මීට අමතරව ප්‍රශ්න පිට වී ඇති බවක් තහවුරු නොවේ.

අධ්‍යාපන විෂයභාර ගරු අමාත්‍යතුමියගේ උපදෙස් මත මෙම ගැටලුව සහ ගැටලුවට ලබාදිය හැකි විසඳුම් ක්‍රියාමාර්ග පිළිබඳ විශ්ලේෂණාත්මක වාර්තාවක් විභාග දෙපාර්තමේන්තුව විසින් අධ්‍යාපන ලේකම් මගින් අධ්‍යාපන විෂයභාර ගරු අමාත්‍යතුමියට ඉදිරිපත් කරන ලදී. එම වාර්තාව අධ්‍යයනය කර, ගතයුතු වඩාත් සුදුසුම ක්‍රියාමාර්ග නිර්දේශ කිරීම සඳහා දේශීය හා විදේශීය විශේෂඥ කමිටුවක් අධ්‍යාපන විෂයභාර ගරු අමාත්‍යතුමිය විසින් පත් කරන ලදී. එම කමිටුව අධ්‍යාපනඥයින්, අධ්‍යාපන මනෝවිද්‍යාඥවරුන්, විශේෂඥ වෛද්‍යවරුන් හා සංඛ්‍යානය පිළිබඳ විද්වතුන්ගෙන් සමන්විත විය.

විභාගය නැවත පැවැත්වීම අවුරුදු 10ක පමණ වයසේ පසුවන දරුවන්ගේ මානසික මට්ටමට දැඩි බලපෑමක් හා පීඩාවක් ඇති කරන බවත්, දරුවන් සියලු දෙනාට සාධාරණයක් ඉටු කිරීම අත්‍යාවශ්‍ය බවත්, වඩාත් සුදුසුම විකල්පය ලෙස විභාගයට කලින් සාකච්ඡා වූවා යැයි හඳුනාගෙන ඇති ප්‍රශ්න තුන සඳහා විභාගයට පෙනී සිටි සියලුම දරුවන්ට ලකුණු ලබාදීම සුදුසු බවත් එකී විද්වත් කමිටුව විසින් නිර්දේශ කර ඇත.

එමෙන්ම විභාගය නැවත පැවැත්වීම ගුරුවරුන්ටත්, දරුවන්ගේ දෙමව්පියන්ටත් පාසල් පද්ධතියටත් දැඩි පීඩාවක් ගෙනදෙන බව කමිටුව වැඩිදුරටත් පෙන්වා දී ඇත.

ඒ අනුව, එම විද්වත් කමිටුවේ නිර්දේශ පරිදි ක්‍රියා කිරීමට තීරණය කළ බව මෙයින් දැනුම් දෙමු. එසේම ප්‍රශ්නපත්‍ර ඇගයීම් කටයුතු කඩිනමින් ආරම්භ කර අප්‍රමාදව ප්‍රතිඵල නිකුත් කිරීමට කටයුතු කරන බව වැඩිදුරටත් දන්වා සිටිමු.

ජේ.එම්. තිලකා ජයසුන්දර
ලේකම්
අධ්‍යාපන, විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශය

එච්.ජේ.එම්.සී. අමිත් ජයසුන්දර
විභාග කොමසාරිස් ජනරාල්

ගරු අමාත්‍යතුමිය / கௌரவ அமைச்சர் / Hon. Minister
+94112784832
+94112784825
minister.education@moe.gov.lk

ලේකම් / செயலாளர் / Secretary
+94112784811
+94112785162
secretary.education@moe.gov.lk